

# "මහමෙර සේ" සමඟ "ළා හිරු රැස්" මෛත්‍රීගෙන්



සිසිර දිසානායක

තමන් උපන් මව් බිමෙදි තමන්ගේ එදිනෙදා ඉගෙනගැනීමේ කටයුතු, රැකියාවේ කටයුතු වලට අමතරව යම්කිසි කලාවක, ක්‍රීඩාවක හෝ වෙනයම් බාහිර කටයුතුවලද නියැලී සිටියවුනට රටින්




බැහැරව යාමට සිදු වීම කීප ආකාරයකින්ම බලපායි. සිය දෙමව්පිය, නෑ හිතවතුන් අතැර දමා යාමට සිදු වීමත්, වෘත්තිය මෙන්ම අනෙකුත් සමාජසීලි සගයින්ගෙන් වෙන්වීමට සිදුවීමත්, හුරු පරිසරයෙන් මිදීමට සිදු වීමත් අතරට යට කී බාහිර ක්‍රියාකාරකම්ද අත්හිටුවීමට සිදු වීම සැබැවින්ම දරාගැනීමට අපහසු වෙයි. වෙනත් රටක පරිසරයට අනුව තමන් කළ කී දේ ඉදිරියටත් කරගෙන යාමට ඉඩ හසර ලැබෙන්නේ විරලවයි. විශේෂයෙන්ම මව්බස මුල් කරගත් කළා කටයුතුවලට ලැබෙන්නේ අවම අවකාශයකි.

කෙසේ වුවද තමන්ට ඉසිඹුවක්, අවසරයක් ලත් සැනින් තමන් ළෙහි, ලෙසෙහි සඟ- වාගෙන තමන්ගේ දේ එළිදැක්වීමට එවැන්නෝ උනන්දු වෙත්. අපගේ මව් බිමෙන් සංක්‍රමණය වූ විශාල පිරිසක් වසන, බහු සංස්කෘතික වටපිටාවක් නිර්මාණය වී ඇති ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ අපගේ පිරිස අතරින් කැපී පෙනෙනා වෘත්තිකෙයකි මෛත්‍රී පනාගොඩ අධිනීතීඥවරයා. වෘත්තීමය වශයෙන් සම්මානනීය සේවයක්, විශේෂයෙන්ම ආදී වාසී ජන ප්‍රජාව වෙනුවෙන් කරනා මෛත්‍රී පනාගොඩ ප්‍රවීණ ගේය පද නිබන්ධකයාණන් දෙවන වරටත් සිය නිර්මාණාත්මක ජන්මය ලබන්නේ සිඩ්නි නුවරදීය.

කොළඹ ආනන්ද විද්‍යාලයීය ශිෂ්‍යයෙකු ලෙසින් සිය ගී පද රචනා කලාව අරඹන මෛත්‍රී පනාගොඩ තරුණයාගේ පාසැලේ සමකාලීන ගී පද රචකයෙකි කුලරත්න ආරියවංශ ප්‍රවීණයන්. එද එලෙසින් මුල් වතාවට නිර්මාණාත්මක ජන්මය ලද මෛත්‍රී පනාගොඩ නිබන්ධයකයාණන් ඒ කාලයේ නිර්මාණය වුන තමන්ගේ ගී පද රචනා රැසක් ඇතුලත් 'සුදු වැලි මතුපිට' සංගත තැටිය එළි දැක්වුයේ මීට වසර කිහිපයකය කලින්. වැඩිදුර අධ්‍යාපන කටුයුතු සඳහා යුරෝපයටත්, රැකියාව සමඟින් මෙරටටත් සංක්‍රමණය වුවද තමන්ට දිගු කාලයක් තිස්සේ මඟ හැරී ගිය කලාවට දෙවන වරටත් ජන්මය ලබා දෙමින් එක් වුණ නිර්මාණ පෙළහර ඔක්තෝම්බර් මස 14 දින සිඩ්නි නුවරදී එළිදැක්වීමට නියමිතයි.

'මහමෙර සේ' සංගත තැටි යුගලයත් "ළා හිරු රැස්" ළමා ගී එකතුවත්, කවි එකතුවකුත් එදින එළිදැක්වෙනු ඇත.




මෛත්‍රී පනාගොඩ ගී සංකල්පනා ඇතුලත් 'මහමෙර සේ' සංගත තැටි යුගලය ගීත 25 කින් සමන්විතයි. දිවංගත පණ්ඩිත් අමරදේවයන් අවසන්

වතාවට එළිදැක් වූ "සොඳුරු වූ මිනිසා" සංගීත තැටියට ඇතුලත් වූ "සෙවනැලි මිය යන සැන්දෑවේ" ගීතය ද මේ එකතුවට ඇතුලත්. එහි සංගීතය පණ්ඩිත් අමරදේවයන්ගේමයි. සිදදියට ගිය පුතු එනතුරු බලා සිටින වියපත් පියෙකුගේ ආත්ම ප්‍රකාශනයකි ඒ. ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ සංගීතයට අනුව සුනිල් එදිරිසිංහයන් ගැයූ "තිරය වැසී යයි" ගීයද ජීවිතයේ අගභාගයට එළැඹෙන ශිල්පියෙකු තුළින් ජීවන යථාර්ථය ලියැවුණු පද පෙළකි. ආචාර්ය නන්ද මාලනීය සමඟ උපුල් මහේන් ගයනා ගීය, රජ කුමරකු හා ගැමි ලියක අතර ප්‍රේම සල්ලාපයකි. උපුල් මහේන් ආචාර්ය වික්ටර් රත්නායකයන් සමඟ ගයනා 'සත් මුහුදෙන්' ගීය විදෙස් ගත පුතෙකු සහ ගමේ වෙසෙන පියාණන් අතර කතිකාවකි. උපුල් විශාරද නෙලු අධිකාරි සමඟින් ද යුග ගායනාවකට එක් වන්නේය.

යට කී ගීවලට අමතරව චාමික සිරිමාන්න ගයන ''ඉගිලී යන ඔබ'' ගීතය ද සංගීතවත් කරන්නේ ආචාර්ය රෝහණ වීරසිංහ සංගීතවේදියාණන්. විශාරද ජගත් වික්‍රමසිංහ ගී තුනක- ින්ම සම්මාදම් වන්නේ ඉන් දෙකකට සං- ගීතය නිර්මාණය කර ගන්නේය. කලකට පෙර ටී. එම් ජයරත්නයන් සමඟ නීලා වික්‍රමසිංහ විශාරදවරිය ගැයූ ''මල් බර මල් වැසි'' ගීතය සංගීතවත් කළේ දිවංගත ආචාර්ය ප්‍රේමසිරි කේමදාස සංගීතවේදියාණන්.

අරුණ සහ තමාරා කන්නංගර ගායනා ගීතය සංගීතය නවරත්න ගමගේ සංගීතවේදියාණන්ගෙනි.




